## 18. මාර්ග ප්‍රත්‍යයේ ත්‍රි රාශිය

සහේතුක සිත් එක් සැත්තෑවෙක ඇති පඤ්ඤා විතක්ක සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව විරිය සති ඒකග්ගතා දිට්ඨි යන මාර්ගාංග ධර්ම නවය මාර්ග ප්‍රත්‍ය ධර්මයෝ ය.

සහේතුක සිත් එක් සැත්තෑවය, චෛතසික දෙපනසය, සහේතුක චිත්තජ රූපය, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපය යන මොහු මාර්ග ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

අහේතුක සිත් අටළොස ය, ඡන්ද වර්ජිත අන්‍ය සමාන චෛතසික දොළොසය, අහේතුක චිත්තජ රූපය, අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපය, බාහිර රූපය, ආහාරජ රූපය, ඍතුජ රූපය, අසංඥ සත්ත්ව කර්මජ රූපය, ප්‍රවෘත්ති කර්මජ රූපය යන මොහු මාර්ග ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

---

**මග්ගපච්චයො** - 'මග්ග' ශබ්දය ගමන අර්ථය කියයි. මෙහි ගමනකට හා සමාන වන්නා වූ ප්‍රඥා ආදිය මග්ග යැයි කියනු ලැබේ. විස්තර කරන්නෙමි - මාර්ගය මගින් යහපත් හෝ අයහපත් ස්ථානයකට පමුණුවන්නාක් මෙන් මෙම ප්‍රඥා ආදී සම්මා මාර්ගාංගයන් විසින් දුගති භවයෙන් සුගති භවයටත්, අපරිශුද්ධ වන සංකිලේස පක්ෂයේ සිට පරිශුද්ධ වන වෝදාන පක්ෂයටත් පමුණුවනු ලබන අතර දිට්ඨි ආදී මිච්ඡා මාර්ගාංගයන් විසින් සුගති භවයෙන් දුගති භවයටත්, වෝදාන පක්ෂයේ සිට සංකිලේස පක්ෂයටත් පමුණුවනු ලබත්. මෙසේ යහපත් හෝ වේවා අයහපත් හෝ වේවා ඒ ඒ භවයන්ට පමුණුවන්නා වූ ශක්තිය මග්ග ප්‍රත්‍ය නම් වේ.

**ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න** - ලෝභ මූල පළමු සිතෙහි වීරිය, ඒකග්‍රතාව, දිට්ඨිය යන මාර්ගාංග යෙදෙන අතර විතර්කය මාර්ග ප්‍රත්‍යය වේ. එම සිත, විතර්කය හැර සෙසු චෛතසික අටළොස සහ චිත්තජ රූප මාර්ග ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න වේ. මේ ආදී වශයෙන් දතයුතුය. මාර්ගාංග දොළොසෙහි පරමාර්ථ ධර්මයන් උද්ධරණය සහ සම්මා මාර්ගාංග, මිච්ඡා මාර්ගාංග බෙදෙන ආකාරය අභිධර්මාර්ථ සංග්‍රහ සමුච්චය කාණ්ඩ භාෂාටීකාවේ දක්වේ.